#mediaethicsSL #Sinhalanews #SinhalaPress #TVchannels #lka #HiruTv #TvDerana #Swarnavahini #SiyathaTv #SirasaTV #ShakthiTV #Resa #Lankadeepa #SundayDivaina #SundayMawbima #SathiAgaAruna #Mawbima #Ada #Dinamina

පසුගිය දින ගා/උපනන්ද විද්‍යාලයේදී සිසු දරුවෙකුගේ පියෙකුට පාසැල් ආරක්ෂක සේවයේ යෙදී සිටි යුද සෙබළා විසින් වෙඩි තැබුවේ යැයි කියවෙන සිදුවීම විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍යයන් තුළ ප්‍රධාන පුවතක් බවට පත්ව තිබිණි. එහිදී තෝරාගත් විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍යයන් මගින් එම සිදුවීම වාර්තා කළ අන්දම පහත දැක්වේ.

මෙහිදී දැකිය හැකි වන්නේ ඇතැම් මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යයන් මගින් බාලවයස්කරුවන්ගේ සංවේදී හඬපට/ප්‍රකාශයන් පළ කරන අතරම, බාලවයස්කරුවන් ඇතුළු පවුලේ අයගේ ඡායාරූප පළ කොට තිබීමයි. තවත් මාධ්‍ය මගින් එම සංවේදී හඬපට/ප්‍රකාශයන් පළ කොට තිබුණත්, ඡායාරූප බොඳ කර පළ කොට තිබිණි. මේ අතර තවත් මාධ්‍ය කිහිපයක්ම වඩාත් ආචාර ධාර්මික අයුරින් බාලවයස්කරුවන්ගේ ඡායාරූපයන් හෝ සංවේදී හඬපට/ප්‍රකාශයන් කිසිත් නොමැතිව සිදුවීම වාර්තා කොට ඇත.

පළමුව, බාලවයස්කරුවන්ගේ පාසල් අධ්‍යාපනයට බාධා ඇතිවන අයුරින් ඔවුන්ගේ අනන්‍යතාවයන් හෙළි නොකළ යුතු බව ජනමාධ්‍ය ආචාර ධර්මයකි. මෙහිදී මෙම සිදුවීම පුළුල් මහජන අවධානයක් ලබාගෙන තිබුණත්, එම බාලවයස්කරුවන්ගේ ඡායාරූප පළ කිරීම සාධාරණීකරණය කළ හැකි නොවේ.

දෙවනුව, මෙවන් අවස්ථාවක කම්පනයට, තැවුලට පත්ව සිටින්නවුන්ගෙන් ප්‍රකාශයන් ලබාගැනීමේදී මාධ්‍යවේදීන් සහකම්පනයෙන් සහ මානුෂීය බවකින් කටයුතු කළ යුතු බව කිව යුතුවේ. මෙම දරුවන්ගෙන් ලබාගත් හඬපට/ප්‍රකාශයන් පළ කිරීමේදී අදාළ මාධ්‍යවේදීන් එසේ කටයුතු කොට ඇතැයි ඔබ සිතන්නේද? මෙවැනි කම්පනයක් දනවන සිදුවීමක දී දරුවන්ගෙන් සිදුවීම සම්බන්ධව ප්‍රකාශයන් ලබා ගැනීම උචිත යැයි ඔබ සිතන්නේ ද ?

https://accountablejournalism.org/ethics-codes/child-rights-international-network-reporting-on-children

See Less